# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு

## MINISTRY OF PLANTATION INDUSTRIES

# තුරුසවිය අරමුදල

## துறுசவிய நிதியம்

## THURUSAVIYA FUND



වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
**Annual Report** **2012**

# දර්ශනය

දේශීය රබර් කර්මාන්තය ශ්‍රී ලංකාවේ පළමු පෙළේ
විදේශීය විනිමය උපයන කර්මාන්තයක්
බවට පත් කිරීම.

# මෙහෙවර

රබර් කර්මාන්තයට, වැඩි ඵලදායීතාවය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම මගින්
කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ආර්ථික තත්ත්වය නංවා ලීමට කටයුතු කිරීමෙන්
සමස්ත දේශීය රබර් කර්මාන්තය ශක්තිමත් කිරීම හා
ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගැනීම.

# හැඳින්වීම

තුරුසවිය අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2000 අංක 23 දරණ තුරුසවිය අරමුදල පනත මගින් ස්ථාපිත කරන ලද සංස්ථාවකි. එය කොළඹ 02, වොක්ස්හෝල් පටුමඟ, අංක 55/75, දරණ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටා ඇත.

මෙරට රබර් කර්මාන්තයෙන් උපයනු ලබන විදේශ විනිමය වැඩි කොටසක් එනම් 70% ක් පමණ උපයනු ලබන්නේ කුඩා රබර් ඉඩම් හිමියන් විසිනි. දේශීය වෙළඳපොල මෙන්ම ලෝක වෙළඳපොලේ ද ස්වාභාවික රබර් සඳහා ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළ යන ප්‍රවනතාවක් පවතී.

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම හා වෙළඳපොල නැංවීම මගින් ජාතික මට්ටමින් ඔවුන් ශක්තිමත් කිරීම තුරුසවිය අරමුදල මගින් සිදු කරයි. කළුතර, කෑගල්ල, කුරුණෑගල, මහනුවර, රත්නපුර, මොණරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ, ගම්පහ අම්පාර යන දිස්ත්‍රික්කවල ගම් මට්ටමින් විසිර ඇති කුඩා රබර් ඉඩම් හිමියන් ඒකරාශි කර ප්‍රාථමික තුරුසවිය සමිති පිහිටුවා ඇති අතර, එම ප්‍රාථමික තුරුසවිය සමිති නියෝජනය කරමින් කළුතර, කෑගල්ල, රත්නපුර, ගාල්ල හා කොළඹ යන දිස්ත්‍රික්ක සඳහා ප්‍රාදේශීය තුරුසවිය සමිති (දිස්ත්‍රික් සංවිධාන) 05 ක් පිහිටුවා ඇත. ප්‍රාදේශීය තුරුසවිය සමිති නියෝජනය කරමින් ශ්‍රී ලංකා කුඩා රබර් වතු සංවර්ධන සමිති සම්මේලනය පිහිටුවා ඇත.

තුරුසවිය අරමුදල පනතට අනුව, තුරුසවිය අරමුදල පිහිටුවීමේ පරමාර්ථ

- (අ) කුඩා රබර් වතු හිමියන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරවීම සහ ඔවුන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීම
- (ආ) රබර් කර්මාන්තය ආශ්‍රිතව වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීම
- (ඇ) කුඩා රබර් වතුවල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය රබර් පිරි සැකසුම් ඒකක සහ රබර් කර්මාන්ත ශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, වැඩි දියුණු කර ගැනීම හෝ පිහිටුවීම
- (ඈ) එවැනි රබර් පිරි සැකසුම් ඒකකවල හෝ කර්මාන්තශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම
- (ඉ) කුඩා රබර් වතු සංවර්ධන සමිති (තුරුසවිය සමිති) ලියාපදිංචි කිරීම සහ විධිමත් කිරීම සහ අරමුදල වෙත ලියාපදිංචි වූ එකී සමිතිවල සාමාජිකයින් සඳහා ආධාර ලබා දීම.
- (ඊ) කුඩා රබර් වතුවල රබර් නිෂ්පාදන කටයුතුවල යෙදී සිටින තැනැත්තන්ගේ වැඩි දියුණුව හා යහපත සඳහා අවශ්‍ය විය හැකි පියවර ගැනීම.

තුරුසවිය අරමුදලේ උපාය මාර්ගික සංවර්ධන අරමුණු

1. තත්ත්වයෙන් උසස් ගුණාත්මක නිෂ්පාදන ලබා දීම.
2. පරිසර සංරක්ෂණය තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.
3. කුඩා රබර් ඉඩම් හිමියනගේ නිෂ්පාදන සඳහා නියම මිලක් ලබාදීම.
4. කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමාජ, ආර්ථික ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

# පටුන


| | | |
|---|---|---|
| සභාපතිතුමාගේ පණිවුඩය | - | 01 |
| තුරුසවිය අරමුදලේ කළමනාකරණ මණ්ඩලය | - | 02 |
| තුරුසවිය අරමුදලේ විගණන හා කළමනාකරණ කමිටුව | - | 03 |
| තුරුසවිය අරමුදලේ කාර්යය මණ්ඩලය | - | 04 |
| තුරුසවිය අරමුදලේ වර්ථමාන ආයතනික සංයුතිය | - | 05 - 06 |
| 2012 වර්ෂයේ ප්‍රගතිය | - | 07 - 15 |
| අවසාන ගිණුම් වාර්තාව - 2012 | - | 16 – 31 |
| විගණකාධිපති වාර්තාව - 2012 | - | |

# සභාපතිතුමාගේ පණිවුඩය

මහින්ද චින්තන ඉදිරි දැක්ම හා තුරුසවිය අරමුදලේ අරමුණුවලට අනුව ගත වූ 2012 වසර තුළ තුරුසවිය අරමුදල සංවර්ධන කටයුතු වලින් අතිමහත් සාර්ථකත්වයක් ළඟා කර ගත් බව ඔබ සැමට දැනුම් දෙන්නේ ඉමහත් සතුටිනි. මෙම ජයග්‍රහණයන් අප ළඟා කර ගන්නේ පසුගිය වර්ෂයේ පැවති අභියෝගාත්මක ඉලක්කවලට මුහුණ දෙමිනි. නිෂ්පාදනයේ අභිමානවත් විශිෂ්ඨත්වයක් කුඩා රබර් ඉඩම් හිමියන් විසින් ලබාගෙන 2012 වසර ගෝලීය ආර්ථිකයට නව අභියෝග රැසක් එක් කළ වසරකි.

දිවයින පුරා විසිරී සිටින කුඩා රබර් ඉඩම් හිමියන් හමු වී ඔවුන්ගේ ගැටළු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබාදී යථෝක්ත ජයග්‍රහණයන් සාක්ෂාත් කර ගැනීම සඳහා තුරුසවිය අරමුදල මඟින් ආර්ථික සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් ලබාදී ඇති බව සතුටින් දන්වමි. පසුගිය වර්ෂයේදී ඉහළ වේගයකින් සංවර්ධනය වූ ශ්‍රී ලංකාවේ රබර් වගාව තුළින් තිරසාර සංවර්ධනයක් උදෙසා තුරුසවිය අරමුදල මඟින් ව්‍යාපෘති රාශියක් කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ආරම්භ කර ඇත.

ඒ අනුව, දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ යට්ටපාත හා හැඩිගල්ල තුරුසවිය සමිති සඳහාත්, කෑගල්ල දිස්ත්‍රික්කයේ පන්දෙණිය තුරුසවිය සමිතිය සඳහාත් රත්නපුර දිස්ත්‍රික්කයේ කරවිට ජනපදය තුරුසවිය සමිතිය සඳහාත් සමූහ සැකසුම් මධ්‍යස්ථාන 04 ක් ඉදිකර ඇත. මේවායින් කුඩා රබර් ඉඩම් හිමි සමිති සාමාජිකයින් විශාල පිරිසකට ඉමහත් සේවාවක් සෘජුව ම සිදු වනු ඇත. මීට අමතරව ඉදිරි වර්ෂවලදී රබර් වැවෙන සැම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය මට්ටමින් දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කර ඇත.

පෙර වර්ෂවල පරිදි අදාළ ඉලක්ක ගත සංවර්ධන ව්‍යාපෘතිවලට අමතරව කුඩා රබර් ඉඩම් හිමියන්ගේ උන්නතිය සඳහා ලංකා බැංකුව හා තුරුසවිය අරමුදල එක්ව ඉතා අඩු පොලී අනුපාතයකට බැංකු ණය ක්‍රමයක් හඳුන්වා දී ඔවුන්ගේ යටිතල පහසුකම් හා නිෂ්පාදන කටයුතුවල සාර්ථකත්වයක් කරා ගෙන යැමට ණය යෝජනා ව්‍යාපෘති ක්‍රමයක් ආරම්භ කරන ලදී.

වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමා දිවයින පුරා සිටින කුඩා රබර් ඉඩම් හිමි තුරුසවිය සමිති සාමාජිකයින් ඒකරාශි කර දිස්ත්‍රික් මට්ටමින් ඔවුන් හමු වී සංවාදශීලී සාකච්ඡා පවත්වමින් එමඟින් ඔවුන්ගේ ගැටළු හඳුනාගෙන විසඳුම් වලට පැමිණීම ද මේ වසරේ සිදුවූ තවත් සුවිශේෂී කරුණකි.මෙය කුඩා රබර් ඉඩම් හිමියාගේ රබර් වගාව දිරිමත් කිරීමට විශාල ශක්තියක් හා ධෛර්‍යයක් වූ බව අතිශය ප්‍රීතියෙන් දන්වනු කැමැත්තෙමු.

මෙම ජයග්‍රහණ සියල්ලම පිටුපස සිටිනුයේ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරීන්, රබර් පර්යේෂණායතනයේ සභාපතිතුමා ඇතුළු නිලධාරීන් හා තුරුසවිය අරමුදල සේවක මණ්ඩලයත්ය. ඒ සඳහා මාගේ හෘදයාංගම ස්තුතිය පල කරන්නට මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම මඟින් මෙවැනි සංවර්ධන ව්‍යාපෘති ආරම්භකර ස්වයංපෝෂිත රටක් බවට පත්කිරීමට ශ්‍රී ලංකා රජයේත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේත් අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ හා කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව සංවර්ධනයේ දිගු ගමනක් ඒමට අත හිත දුන් සැමට සුභාශිංසන පිරිනමමින් ඉදිරියටත් දිගු ගමනක් යැමට ශක්තිය ධෛර්යය ලැබේවායි! ප්‍රාර්ථනා කරමි.

එස්.පී.හිඳැල්ලආරච්චි
සභාපති.

# තුරුසවිය අරමුදල කළමනාකරණ මණ්ඩලය

| | |
|---|---|
| එස්.පි. හිඳැල්ලආරච්චි මහතා | - සභාපති, (තුරුසවිය අරමුදල) |
| ආර්.බී. ප්‍රේමදාස මහතා | - සාමාජික(අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| පී.එච්.එස්.ඩබ්. බංඩාර මහතා | - සාමාජික (අධ්‍යක්ෂ (මුදල්) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| ජේ. යූ. පීරිස් මහතා | - සාමාජික ( සභාපති, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය) |
| එන්.පී. කාරියවසම් මහතා | - සාමාජික (සභාපති, කුඩා තේවතු සංවර්ධන අධිකාරිය) |
| එස්.ඒ.ජේ. බංඩාර මහතා | - සාමාජික (කළමණාකරු, රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව) 2010.07.01 සිට 2012.03.31 දක්වා |
| එස්.ඩබ්. ගමගේ මහතා | - සාමාජික (නිසිබලධාරී, රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව) 2012.06.01 දින සිට |
| හසන්ත පෙරේරා මහතා | - සාමාජික (සභාපති, රත්නපුර-ප්‍රාදේශිය තුරුසවිය සමිතිය)2012.6.1 |
| ශ්‍යාමන්ත සමරජීව මහතා | - සාමාජික (සභාපති, කැගල්ල-ප්‍රාදේශිය තුරුසවිය සමිතිය) |
| රෝහණ ගලබොඩ මහතා | - සාමාජික (සභාපති, කළුතර - ප්‍රාදේශිය තුරුසවිය සමිතිය) |
| පියසේන මහආරච්චි මහතා | - සාමාජික (සභාපති, ගාල්ල - ප්‍රාදේශිය තුරුසවිය සමිතිය) |
| ජේ.ඩී.එස්. වික්‍රමරත්න මහත්මිය | - සාමාජික (සභාපති, කොළඹ / ගම්පහ ප්‍රාදේශිය තුරුසවිය සමිතිය) |
| නන්දන ගුරුවිට මහතා | - සාමාජික |
| එම්.එස්.එස්.කේ ලියන්වල මහතා | - නිරීක්ෂක |

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 12.

බැංකු

මහජන බැංකුව,
යූනියන් පෙදෙස ශාඛාව,
කොළඹ 02.

ප්‍රධාන කාර්යාලය

තුරුසවිය අරමුදල,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 55/75, වොක්ස්හෝල් පටුමග,
කොළඹ 02.

| දුරකථන අංක | | |
|---|---|---|
| | සභාපති | 011 - 2333531 |
| | පොදු | 011 - 2333532 |
| | අධ්‍යක්ෂ | 011 - 3137311 |
| | ෆැක්ස් | 011 - 2333531 |

ඊ මේල් Chairthuru@sltnet.lk

# 2012 තුරුසවිය අරමුදල විගණන හා කළමනාකරණ කමිටුව

| | | |
|---|---|---|
| ඩී.ඒ. පී. අබේසේකර මහතා | - | සභාපති (අධ්‍යක්ෂ , රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව) |
| ආර්.බී. ප්‍රේමදාස මහතා | - | සාමාජික (අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| පී.එච්.එස්.ඩබ්. බංඩාර මහතා | - | සාමාජික (අධ්‍යක්ෂ (මුදල්) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| එච්.ඒ.ඩී.ඩී.එම්.ප්‍රියන්ත මහතා | - | සාමාජික (අභ්‍යන්තර විගණක,වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) |
| ආර්.එම්.බී.එස්.රත්නායක මිය | - | සාමාජික (විගණන අධිකාර්, විගණනකාධිපති දෙපාර්තමේන්තුව) |

# තුරුසවිය අරමුදල - කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| සභාපති | එස්.පී. හිදැල්ලආරච්චි මහතා |
| අධ්‍යක්ෂ | එච්.ඒ.එස්. කුමාරි විමලසූරිය මහත්මිය |
| වැඩ බලන ගණකාධිකාරී | එන්.ජී.පියසේන මහතා |
| පරිපාලන නිලධාරී | ලලනි ගමගේ මහත්මිය |
| ලිපිකරු | ආර්.ආර්. දෙහිපිටිය මහත්මිය |
| | එල්.ඒ.පී. චන්ද්‍රිකා මහත්මිය |
| | නිෂාදි සේනානායක මහත්මිය |
| | සමන්ත කුමාර මහතා 2002.07.01 සිට 2012.06.21 දක්වා |
| | සුදත් ගලබඩ මහතා |
| | තුෂාරි ප්‍රියංගිකා මහත්මිය |
| | නයනා දර්ශනි මහත්මිය |
| සහකාර සමිති | සඳකැළුම් ප්‍රභාද සිල්වා මහත්මිය |
| ප්‍රවර්ධන නිලධාරී | චන්දිමා ප්‍රියදර්ශනි මහත්මිය |
| | රංජනී සේනසිරි මහත්මිය 2002.08.23 සිට 2012.06.25 |
| | මංගලා කුමාරිහාමි මෙනවිය |
| | අමිතා රත්නායක මහත්මිය |
| රියදුරු | ජානක වාද්දුවගේ මහතා - 2001.06.25 2012.06.06 |
| | අජිත් නන්දසිරි මහතා - 2006.03.20 2012.09.12 |
| | ඩබ්. ධර්මපාල මහතා - 2012.09.03 සිට |
| | ජී. නිහාල් කුමාරසිරි ද සිල්වා - 2012.07.03. සිට |
| කාර්යාල කාර්ය සහායක | ප්‍රසන්න සමරතුංග මහතා |

## තුරුසවිය අරමුදලේ වර්තමාන ආයතනික සංයුතිය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන තුරුසවිය අරමුදලේ ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ෂ්හෝල් පටුමඟ, අංක 55 / 75, දරණ ස්ථානයේ පිහිටුවා ඇත.

රබර් වගාවේ නිරතව සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ජීවන තත්වය උසස්කර ඔවුන්ගේ යටිතල පහසුකම් දියුණු කර ඒ තුලින් ස්වයංපෝෂිත ජන සමාජයක් ගොඩ නගා ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දීම අප ආයතනයේ අභිලාෂයයි. රබර් වගාවේ සංවර්ධනය සඳහා කුඩා රබර් ඉඩම් හිමියන් වෙත වඩාත් කාර්යයක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් දිස්ත්‍රික් මට්ටමින් පහත සඳහන් පරිදි ප්‍රාදේශීය කාර්යාල 05ක් පිහිටුවා සම්බන්ධීකරණ නිළධාරීන් පත් කර මෙහෙයුම් වැඩ සටහන් ආරම්භ කර ඇත.

1. කෑගල්ල, කුරුණෑගල, මහනුවර, මාතලේ (කෑගල්ල ර. සං. දෙ. ප්‍රාදේශීය කාර්යාලය තුල)
2. කළුතර (කළුතර ර. සං. දෙ. ප්‍රාදේශීය කාර්යාලය තුල)
3. රත්නපුර, මොණරාගල (රත්නපුර ර. සං. දෙ. ප්‍රාදේශීය කාර්යාලය තුල)
4. ගාල්ල, මාතර, හම්බන්තොට (ගාල්ල ර. සං. දෙ. ප්‍රාදේශීය කාර්යාලය තුල)
5. කොළඹ, ගම්පහ, (කොළඹ 02 තුරුසවිය ප්‍රධාන කාර්යාලය තුල)

### ප්‍රධාන කාර්යාලයේ කාර්යයන්

- 2000 අංක 23 දරණ තුරුසවිය අරමුදල පනතට අනුව, පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරිම.
- බිම් මට්ටමේ විසිරී ඇති කුඩා රබර් වතු හිමියන් ඒකරාශී කර ඔවුන් දැනුවත් කර තුරුසවිය සමිති පිහිටුවීම.
- පිහිටුවා ගත් තුරුසවිය සමිති තුරුසවිය අරමුදල යටතේ , ලියාපදිංචි කිරිම.
- කුඩා රබර් ඉඩම් හිමියන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් පිහිටුවා ඇති තුරුසවිය සමිති සාමාජිකයන් සඳහා සේවාවන් සැපයීම.
- ගුණාත්මක භාවයෙන් යුත් රබර් නිෂ්පාදන සඳහා තාක්ෂණික දැනුම ලබා දීම.
- තත්වයෙන් උසස් රබර් ෂීට් නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් යුත් උපකරණ ලබා දීම.
- මනා කළමණාකාරීත්වයකින් යුතු සමිතියක සාමාජිය හා ආර්ථික වැදගත් කම් පිළිබඳව කුඩා රබර් ඉඩම් හිමියන් දැනුවත් කිරිම.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම ව්‍යපෘතිය යටතේ දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සමුහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකර, ප්‍රමිතියෙන් හා ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනය කර ඉහළ මිලක් ලබා ගැනිම සඳහා කටයුතු කිරිම.
- කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ණය යෝජනා ක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කිරිම.
- අමාත්‍යාංශයෙන් හා වෙනත් ආයතන වලින් රබර් වගාව වැඩි දියුණු කිරිම සඳහා ලැබෙන යෝජනා හා ප්‍රශ්න වලට කඩිනම් පිළිතුරු ලබා දීම
- පරිපාලන හා ගිණුම්කරණ කටයුතු කිරිම.

**ප්‍රාදේශීය කාර්යාල තුලින් ඉටු කරන ප්‍රධාන සේවාවන්.**

දිස්ත්‍රික්කයේ රාජකාර් කටයුතු සඳහා තුරුසවිය සම්බන්ධීකරණ නිළධාරීන් ඒ ඒ දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය මට්ටමේ ඇති තුරුසවිය සමිති අධීක්ෂණය සඳහා යොදවා පහත සඳහන් සේවාවන් ඔවුන්ගෙන් ඉටු වනවා ඇත.

- මාසික ඉදිරි වැඩ සටහන් ප්‍රධාන කාර්යාලය වෙත යවා, අනුමත කර ගනු ලබන අතර, එම මාසික ඉදිරි වැඩ සටහන් සංශෝධනය කරන්නේ නම් සංශෝධිත වැඩසටහන්ද, එකී මාසය අවසානයේ ඉටු කල වැඩ වාර්තාද, ප්‍රධාන කාර්යාලයට යවා ඒ පිළිබඳ සමාලෝචන හා ඊළඟ මාසයේ කල යුතු වැඩ සම්බන්ධව අවශ්‍ය පැවරීම් පිළිබඳ උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීම.
- මාස 03කට වරක් පැවැත් වූ මහ සභා රැස්වීම් වලට සහභාගී කර වීම.
- තුරුසවිය සමිති අධීක්ෂණ වාර්ථා ප්‍රධාන කාර්යාලයට එවීම.
- ගම් මට්ටමේ ප්‍රදේශීය මට්ටමෙන් නව තුරුසවිය සමිති පිහිටු වීම.
- අක්‍රියව පැවති තුරුසවිය සමිති ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සැලසීම.
- ගොවි ගැටළු ප්‍රධාන කාර්යාලයට යොමු කර ඒ සඳහා විසඳුම් ලබා දීම.
- නිළවරණ පැවැත්වීම.
- ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම හා කුඩා රබර් වතු හිමියන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- දිස්ත්‍රික්ක මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## තුරුසවිය අරමුදල

ප්‍රාග්ධන වියදම් මිලියන

| ⅃ | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුවේ වටිනාකම | 2011 වර්ෂයේ අවසාන වියදම් | 2012 වර්ෂයේ වෙන් කළ මුදල | අරමුදල් වල ප්‍රභවය | | කාර්තු වශයෙන් මූල්‍යමය ඉලක්කවල ප්‍රගතිය (සමුච්චිත) 4 වන කාර්තුව | කාර්තු වශයෙන් භෞතික ඉලක්කවල ප්‍රගතිය (සමුච්චිත) 4 වන කාර්තුව | සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | **තත්ත්වයෙන් උසස් රබර් ෂීට් නිෂ්පාදනය** | | | | | | | | |
| | 1 දුම්ගෙවල් | 1 | 0.832 | 1 | GF | T | 1 | 15 | |
| | | | | | | P | 0.995 | 15 | |
| | 2 *** සමූහ සැකසුම් මධ්‍යස්ථාන | 9 | 0.712 | 9 | | T | 9 | 4 | සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවෙන් අක් මුදල් නිකුත් කර නැත. |
| | | | | | | P | 3.271 | 4 | |
| | 3 පුහුණු වැඩසටහන් | 0.69 | 0.608 | 0.69 | | T | 0.690 | 25 | |
| | | | | | | P | 0.652 | 18 | |
| | 4 රබර පැල තවාන් | 0.3 | | 0.3 | | T | 0.300 | 1 | |
| | | | | | | P | 0.298 | 1 | |
| 2 | **සම්පත් බෙදා දීම** | | | | | | | | |
| | 1 දියරෝල් හා ඩයමන්රෝල් | 2.35 | 2.198 | 2.35 | GF | T | 2.350 | 156 | |
| | | | | | | P | 2.340 | 156 | |
| 3 | **සමිති පිහිටුවීම හා ශක්තිමත් කිරීම** | | | | | | | | |
| | 1 සමිති ශක්තිමත් කිරීම | 0.497 | 0.135 | 0.497 | GF | T | 0.497 | 400 | |
| | | | | | | P | 0.458 | 400 | |
| | එකතුව | 13.837 | 4.485 | 13.837 | | T | 13.837 | | |
| | | | | | | P | 8.014 | | |

*** ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම ව්‍යාපාතිය යටතේ සමූහ සැකසුම් මධ්‍යස්ථාන 04 ක් කෑගල්ල, කළුතර, රත්නපුර යන දිස්ත්‍රික්කවල ඉදිකිරීම සඳහා රු.මි.9 ක් මුදලක් වෙන් වූ අතර, 2012.12.31 දින වන විට ලැබී ඇති මුදල රු.මි.3.271 කි.

ආයතනය - තුරුසිවිය අරමුදල

ප්‍රාග්ධන වියදම් මිලියන

| | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුවේ වටිනාකම | 2011 වර්ෂයේ අවසාන වියදම් | 2012 වර්ෂයේ වෙන් කළ මුදල | අරමුදල් වල ප්‍රභවය | | කාර්තු වශයෙන් මූල්‍යමය ඉලක්කවල ප්‍රගතිය (සමුච්චිත) | කාර්තු වශයෙන් භෞතික ඉලක්කවල ප්‍රගතිය (සමුච්චිත) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 4 වන කාර්තුව | 4 වන කාර්තුව |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| | 1 ගොඩනැගිලි ඉදිකිරීම | - | - | - | DF | T | - | - |
| | | | | | | P | - | - |
| | 2 වාහන | 0.2 | 0.209 | 0.2 | | T | 0.2 | වාහන අලුත්වැඩියාව |
| | | | | | | P | 0.062 | |
| | 3 කාර්යාල ලිබඩු හා කාර්යාල උපකරණ | 0.15 | 0.144 | 0.15 | | T | 0.150 | ලිපිගොනු කබඩි 06, වානේ කබඩි 02 හා ජංගම දුරකථන 01. |
| | | | | | | P | 0.153 | |
| | එකතුව | 14.187 | 4.838 | 14.187 | | T | 14.187 | |
| | | | | | | P | 8.229 | |

පුනරාවර්තන වියදම් මිලියන

| | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුවේ වටිනාකම | 2011 වර්ෂයේ අවසාන වියදම් | 2012 වර්ෂයේ වෙන් කළ මුදල | අරමුදල් වල ප්‍රභවය | | කාර්තු වශයෙන් මූල්‍යමය ඉලක්කවල ප්‍රගතිය (සමුච්චිත) | කාර්තු වශයෙන් භෞතික ඉලක්කවල ප්‍රගතිය (සමුච්චිත) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 4 වන කාර්තුව | 4 වන කාර්තුව |
| | පුනරාවර්තන වියදම් | | | | | | | |
| | 1 පුද්ගල පඩිනඩි, ප්‍රවාහන හා සැපයුම් | 9.792 | 9.6 | 9.792 | DF | T | 9.792 | |
| | | | | | | P | 9.792 | |
| | වෙනත් පුනරාවර්තන | 1.013 | | 1.013 | GF | T | 1.013 | |
| | | | | | | P | 0.395 | |
| | එකතුව | 10.805 | 9.6 | 10.805 | | T | 10.805 | |
| | | | | | | P | 10.187 | |

## 2012 වර්ෂයේ තුරුසවිය අරමුදල ඉටු කර ඇති සංවර්ධන කාර්යයන් :

නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීම මගින් කුඩා රබර් වතු හිමියන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය නංවාලීම උදෙසා 2012 වර්ෂයේ ද පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර ඇත.

- ❖ තත්ත්වයෙන් හා ගුණාත්මක බවින් උසස් රබර් ෂීට් නිෂ්පාදනය කිරීම.
- ❖ සම්පත් බෙදා දීම
- ❖ සමිති පිහිටුවීම හා සමිති ශක්තිමත් කිරීම.

### ❖ තත්ත්වයෙන් හා ගුණාත්මක බවින් උසස් රබර් ෂීට් නිෂ්පාදනය කිරීම.

### 1. දුම්ගෙවල් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම

කුඩා රබර් ඉඩම් හිමි තුරුසවිය අරමුදලේ සමිති සාමාජිකයින් සඳහා ගුණාත්මක භාවයෙන් යුතු (නො.01, 02) වර්ගවල රබර් ෂීට් නිෂ්පාදනය සඳහා රබර් පර්යේෂණායතනයේ නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූලව දුම් ගෙවල් 15 ක් ඉදිකිරීම සඳහා රු.995,000/- ක මුදලක් වැය කර ඇත.

### 2. සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීම.

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ රබර් කිරි එකතු කර ගුණාත්මක හා ප්‍රමිතියෙන් යුතු දුම් ගැසූ දාර රොටි මෙහිදී නිපදවීම සිදුවේ. ගුණාත්මක බවින් ඉහළ දුම්ගැසූ දාර රොටි නිෂ්පාදනය වන බැවින් අපනයනය සඳහා ද යෝග්‍ය වේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ කළුතර දිස්ත්‍රික්කයේ හැඩිගල්ල ජනපදය තුරුසවිය සමිතිය, යට්ටපාත තුරුසවිය සමිතිය හා රත්නපුර දිස්ත්‍රික්කයේ කරවිට ජනපදය තුරුසවිය සමිති සඳහා සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට කටයුතු කර ඇති අතර, කැගල්ල දිස්ත්‍රික්කයේ සාර්ථකව ක්‍රියාත්මක වන සහ රබර් ෂීට් අපනයනය සිදු කරන තුරුසවිය සමිතියක් වන පන්දෙණිය තුරුසවිය සමිතිය මගින් ක්‍රියාත්මක කරන සමූහ සැකසුම් මධ්‍යස්ථානය සඳහා නව තාක්ෂණයෙන් යුතු දුම්ගෙයක් ඉදිකිරීමට ද කටයුතු කර ඇත.

ඉහත කාර්යයන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ රු.මි. 9 ක් වෙන් වූ අතර, 2012.12.31 දිනට ලැබී ඇති මුදල රු.මි. 3.271 ක් පමණි.

## 3. දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

කුඩා පරිමාණ රබර් ගොවීන් අතර, රබර් ෂීට් නිෂ්පාදනය පිළිබඳව නවීන තාක්ෂණික දැනුම වර්ධනය කිරීම, නිෂ්පාදනවල ගුණාත්මක බව නංවාලීම හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වැඩි වටිනාකමක් ලබාදීම යන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

1. නිවැරදිව රබර් පැල සිටුවීම, නිවැරදි කිරි කැපුම් ක්‍රම, රබර් වගාවට වැළඳෙන ලෙඩරෝග සහ විද්‍යානුකූලව පොහොර යෙදීම යනාදිය සඳහා ක්ෂේත්‍ර වැඩමුළු පවත්වන ලදී.

2. වැහි ආවරණ යෙදීම තුළින් වර්ෂා කාලය තුළ කිරි කැපීමේ දින ගණන වැඩි කර ගැනීමට හැකි වන අතර, එමගින් රබර් කිරි නිෂ්පාදනය 25% - 30% ක් පමණ ප්‍රමාණයකින් නිෂ්පාදනය වැඩිකර ගත හැකි වේ. එහිදී වැහි ආවරණ සවි කිරීමට යොදා ගන්නා ගම් මිශ්‍රණය නිෂ්පාදනය කිරීමටත් වැහි ආවරණ සවි කිරීම පිළිබඳව තුරුසවිය සාමාජිකයින් දැනුවත් කිරීමට දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

3. ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීම. (RSS - 1)
කුඩා රබර් ඉඩම් හිමි තුරුසවිය සමිති සාමාජිකයින් සඳහා දිස්ත්‍රික් මට්ටමින් ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා දීම සිදු කරන ලද අතර, එසේම ඔවුන්ගේ නිෂ්පාදන ගුණාත්මක තත්ත්වයෙන් උසස් කිරීමට අවශ්‍ය දැනුම මෙහිදි ලබා දී ඇත.

දිවයින පුරා සිටින කුඩා රබර් වතු හිමි තුරුසවිය සමිති සාමාජිකයින් ඒකරාශි කර දිස්ත්‍රික්ක මට්ටමින් සංවාදශීලී සාකච්ඡා පවත්වමින් ඔවුන්ගේ ගැටළු හඳුනාගෙන විසඳුම් වලට පැමිණීම ද ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

## පැවැත් වූ පුහුණු වැඩසටහන්

| | දිනය | දිස්ත්‍රික්කය | වැඩසටහන් | ස්ථානය | සහභාගි වූ සාමාජික සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | 2012.02.04 | අනුරාධපුරය | දැයට කිරුළ ප්‍රදර්ශනය | ඔයාමඩුව | |
| 2 | 2012.05.28 | කෑගල්ල | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | හුංගම්පල කුමාරි හිග්ගොඩ මහත්මියගේ පන්ති ශාලාව | 114 |
| 3 | 2012.05.28 | කළුතර | රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | කටුගේන ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානය | 103 |
| 4 | 2012.05.28 | මොණරාගල | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | මොණරාගල ප්‍රජා ශාලාව | 361 |
| 5 | 2012.05.29 | කෑගල්ල | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 100 |
| 6 | 2012.05.29 | මාතර | නො.01 රබර් ෂීට් නිෂ්පාදනය හා දුම්කූටීරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | අකුරැස්ස ගංගාරාම විහාරස්ථානය | 64 |
| 7 | 2012.06.25 | කළුතර | සීලන්ට් ගම් මිශ්‍රණය නිෂ්පාදනය හා වැහි ආවරණ යෙදීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ඇගල්ඔය ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය | 139 |
| 8 | 2012.06.29 | අම්පාර | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | කෝමාණ ප්‍රජා ශාලාව | 30 |
| 9 | 2012.07.31 | කළුතර | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | යට්ටපාත 10 කණුව ප්‍රජා ශාලාව | 94 |

| | දිනය | දිස්ත්‍රික්කය | වැඩසටහන් | ස්ථානය | සහභාගි වූ සාමාජික සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 10 | 2012.08.28 | රත්නපුර | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | කැකුල ප්‍රජා ශාලාව | 78 |
| 11 | 2012.08.30 | ගාල්ල | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | ඇල්පිටිය වසන්ත ගෙස්ට් | 490 |
| 12 | 2012.08.30 | හම්බන්තොට | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | කටුවන ජාතික පාසැල | 400 |
| 13 | 2012.09.01 | අගලවත්ත | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය | 902 |
| 14 | 2012.09.01 | බණ්ඩාරගම | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | බණ්ඩාරගම මෛත්‍රී ශාලාව | 488 |
| 15 | 2012.11.10 | රත්නපුර | ගරු ඇමතිතුමා රබර් ගොවීන් හමුව | ගොඩකවෙල ජාතික පාසැල | 500 |
| 16 | 2012.12.04 හා 05 යන දෙදින | ගාල්ල | රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | ගාල්ල උඩලමත්ත බණ්ඩාරනායකපුර බහු කාර්යය මධ්‍යස්ථානය | 29 |
| 17 | 2012.12.11 | ගම්පහ | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | ලූණුගම මහා විද්‍යාලය | 52 |
| 18 | 2012.12.11 | රත්නපුර | රබර් වගාව, නිවැරදිව කිරි කැපීම, විද්‍යානුකූලව පොහොර යෙදීම, වැහි ආවරණ සවි කිරීම හා රබර් වගාවට වැළදෙන ලෙඩරෝග සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන | කැටේපොල අභිනවාරාම විහාරස්ථානය | 43 |

## 4. බද්ධ පැල තවාන් ආරම්භ කිරීම.

රබර් වගාව තුළ නියැලී සිටින කුඩා රබර් ඉඩම් හිමියන්ට නියමිත කාලයට නියමිත පරිදි රබර් පැල නොලැබී යාමෙන් මහත් දුෂ්කරතාවයකට මුහුණ පෑමට සිදු ඇත. එම දුෂ්කරතා මඟහැර ගැනීම සඳහා තුරුසවිය සමිති සාමාජිකයින් ඒකරාශි කර දිස්ත්‍රික් මට්ටමින් රබර් පර්යේෂණායතනයේ හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් ඇතිව බද්ධ පැල තවාන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වා එමගින් තවාන් ආරම්භ කිරීමට ගොවීන් පොළඹවා ඇත. ඒ අනුව, ගුණාත්මක බවින් ඉහළ රබර් පැල ගොවීන්ට ලබාදීම සඳහා කළුතර දිස්ත්‍රික්කයේ ඇගල්ඔය තුරුසවිය සමිතිය මගින් 2012 වර්ෂයේ රබර් පැල තවානක් ආරම්භ කිරීමට රු.298,000/- ක මුදලක් තුරුසවිය අරමුදල විසින් ලබා දී ඇත.

### ❖ සම්පත් බෙදා දීම.

ගුණාත්මක භාවයෙන් යුතු රබර් ෂීට් නිෂ්පාදනය කිරීම සඳහා රබර් රෝල් ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇත. රබර් පර්යේෂණායතනයේ නිර්දේශිත ප්‍රමිතීන්ට අනුකූලව අතින් ක්‍රියාකරවන හා ඕනෑම තැනක ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක් භාවිතා කරමින් මෙම රබර් රෝල් සවි කර ගත හැක. කුඩා පරිමාණ ගොවීන්ට මෙම සාම්ප්‍රදායික රබර් රෝල් යුගල තුළින් විශාල සේවයක් සිදු කර ගැනීමට හැකි වන අතර, 2012 වර්ෂයේ තුරුසවිය සමිති සඳහා රු.මි.2.340 ක මුදලක් වැය කර රබර් රෝල් 154 ක් ලබා දී ඇත.

### ❖ සමිති පිහිටුවීම හා ශක්තිමත් කිරීම

2012 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය යටතේ තුරුසවිය සමිති 400 ක් පමණ ශක්තිමත් කර නව සමිති සාමාජිකයින්ගේ වර්ධනයක් ද ලබා ගෙන ඇති අතර, ප්‍රමිතියෙන් යුතු උපකරණ ලබා දීමෙන් උසස් තත්ත්වයේ රබර් ෂීට් නිෂ්පාදනය කර වෙළඳපොලට යැවීම තුළින් ද සමිති ශක්තිමත් කර ඇත.

මීට අමතරව පහත සඳහන් පරිදි කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ණය යෝජනා ක්‍රමයක් ද හඳුන්වා දී ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

### ණය යෝජනා ක්‍රමය.

කුඩා රබර් ඉඩම් හිමියන් අතර, නොයෙකුත් ව්‍යවසායකත්ව හැකියාවක් ඇති පිරිසක් සිටියත්, ඔවුන්ගේ එම හැකියාවන් ක්‍රියාවට නැංවීම සඳහා මූල්‍ය ශක්තිය ලබා ගැනීමේ දුෂ්කරතා ඇත. බොහොමයක් ගොවීන් ගැමියන් වන අතර, ඔවුනට මූල්‍ය ආයතන වෙත ගොස් ඔවුන්ගේ ගැටළු හා අවශ්‍යතාවයන් ඉදිරිපත් කර ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට ශක්තියක් නොමැති බව තුරුසවිය අරමුදලට හැඟිණි. ඒ අනුව, ඒ ගැන සලකා බලා තුරුසවිය අරමුදල හා ලංකා බැංකුව එක්ව සහනදායී ක්‍රමවේදයකට අනුව ඉතා අඩු පොලී අනුපාතයකට කුඩා රබර් ඉඩම් හිමියන් ගේ රබර් වගාව, රබර් නැවත වගාව, දුම්ගෙවල් ඉදිකිරීම, රබර් ෂීට් නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා වෙනත් ආදායම් උත්පාදන කටයුතු සඳහා ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇති අතර, එමගින් කුඩා රබර් වතු හිමියන් දෙදෙනෙකුගේ පුද්ගල ඇප මත රු.300,000/- දක්වා ණය මුදලක් ලබා දීමට ඉඩ සලසා ඇත.

## ප්‍රචාරක වැඩසටහන්.

- දැයට කිරුල ජාතික සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයා මඩුව දී පවත්වාගෙන යන ලදි. මෙහිදී පෝස්ටර්, බැනර් හා අත්පත්‍රිකා මගින් මහජනතාව දැනුවත් කරන ලදි.
- දිස්ත්‍රික්ක මට්ටමින් කුඩා රබර් ඉඩම් හිමියන් උදෙසා තුරුසවිය අරමුදල හා ලංකා බැංකුව එක්ව ඉතා අඩු පොළී අනුපාතයකට යටත්ව ණය යෝජනා ක්‍රමයක් හදුන්වා දීම, දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුහුණු වැඩ සටහනක් ලංකා බැංකු මූලස්ථානයේදී පැවැත්වීම.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කුඩා රබර් ඉඩම් හිමි තුරුසවිය සමිති සාමාජිකයින් ඒකරාශී කර දිස්ත්‍රික්ක මට්ටමින් සංවාදශීලී සාකච්ඡා පවත්වමින් ගොවීන්ගේ ගැටළු හදුනාගෙන විසදුම් ලබා දීමට කටයුතු කිරීම.

## පරිපාලන කටයුතු

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පුහුණුව සඳහා ගිණුම් අංශයේ නිළධාරිණියක් සහභාගි කරවීම.
- සේවකයින් ස්ථිර කර ගැනිම සඳහා අමාත්‍යාංශයේ නිර්දේශය ලබා ගෙන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීම.
- ආයතනික ප්‍රධානීන් විදේශ සමුළුවලට සහභාගී කර වීම.
- වැවිලි අංශය සඳහා සුපිරිසිදු නිෂ්පාදන ප්‍රතිපත්තීන් හා උපාය මාර්ගයන් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව සඳහා නිළධාරීන් සහභාගී කරවීම.

## පොදු කරුණු

1. නව වසරේ රාජකාරි ආරම්භ කිරීම.

   පෙර වර්ෂ වලදී මෙන්ම 2012 වර්ෂයේ දීද තුරුසවිය අරමුදලේ කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් අමාත්‍යාංශ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ උත්සවයට සහභාගී වී ජාතික කොඩිය ඔසවා, ජාතික ගීය ගායනා කරන ලදි. ඉන් පසු සියළු දෙනාම රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව කියවා කැපවීමෙන්, අවංකව තම සේවය ඉටු කරන බවට පොරොන්දු වී අදිටන් කර ගන්නා ලදි. ආයතනික වාර්තු ඉටු කිරීමෙන් පසු දෛනික කාර්යය ආරම්භයේදි ආයතනික ප්‍රධානියා විසින් මෙම වසර තුළ අදාල සංවර්ධන හා අනෙකුත් වැඩ කටයුතු සඳහා, නියමිත ඉලක්ක හා වගකීම් සපුරා ගැනීම පිළිබඳව සියලුම සේවක, සේවිකාවන් අවංකව, සමගියෙන් හා දැඩි කැපවීමකින් යුතුව තම රාජකාර්ය ඉටු කල යුතු බව පිළිබඳව දැනුවත් කරන ලදි.

2. උත්සව කටයුතු

   වාර්ෂිකව සිදු කරනු ලබන වෙසක් උත්සව හා සැරසිලි දර්ශනීය ලෙස අලංකාරව සිදු කර ඇත.

3. කාර්යය මණ්ඩල සුභ සාධන කටයුතු

   තුරුසවිය අරමුදලේ සුභ සාධන සංගමය විසින් මෙම සංගමයේ සාමාජිකයින්ට මෙන්ම පොදු කටයුතු වලදී ද අවශ්‍ය කරන සුභසාධන කටයුතු සිදුකර ඇත.

## 2013 වර්ෂයේ සැලසුම්

1. කුඩා රබර් වතු හිමියන් සවිබල ගැන්වීම.
2. නිෂ්පාදන ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රදේශයකට ආවරණය වන පරිදි රබර් සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම තුළින් ගොවීන්ගේ ආදායම් සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
3. වැහි ආවරණ ප්‍රචලිත කිරීම.
4. බද්ධ පැල තවාන් ඇති කිරීමට ගොවියා පෙළඹවීම.
5. කුඩා රබර් ඉඩම් හිමියා සඳහා පර්යේෂණ කටයුතු සඳහා දැනුම හා අවබෝධය ලබාදීම.
6. රබර් ආශ්‍රිත සුළු කර්මාන්ත බිහි කිරීමට ගොවියා පෙළඹවීම.
7. රබර් නැවත වගා හා අලුත් වගාව, තාක්ෂණයෙන් යුතු දුම්ගෙවල් ඉදිකිරීම, රබර් ආශ්‍රිත උපකරණ මිලදී ගැනීම, ගුණාත්මක හා ප්‍රමිතියෙන් යුතු නො.1, 2 වර්ගවල රබර් ෂීට් නිෂ්පාදනය සඳහා ගොවීන් පෙළඹවීම හා කුඩා රබර් ඉඩම් සමිති සාමාජිකයින් අතර මැදියන්ට හසු නොවී වෙළඳපොලෙහි පවතින මිලට රබර් ෂීට් අලෙවි කර ගැනීම පිණිස ගාල්ල, මාතර, කෑගල්ල, කළුතර, රත්නපුර, කොළඹ, ගම්පහ යන දිස්ත්‍රික්කවල සමූහ සැකසුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමටත් සැලසුම් කර තිබීම.
8. දිස්ත්‍රික් මට්ටමින් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම.
9. කුඩා රබර් ඉඩම් හිමි තුරුසවිය සමිති සාමාජිකයින්ගේ උන්නතිය සඳහා තුරුසවිය අරමුදල හා ලංකා බැංකුව එක්ව ඉතා අඩු පොලී අනුපාතයකට ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

2012 වර්ෂයේ තුරුසවිය අරමුදල ආයතනයේ ක්‍රියාකාර සැලැස්මට අනුව සංවර්ධන වැඩ සඳහා වෙන් කර තිබූ මූල්‍ය ප්‍රතිපාදන යටතේ අදාල ඉලක්ක සම්පූර්ණ කර ඇති අතර, සංවර්ධන කටයුතු වල ප්‍රගතිය 95.3%ක් වේ.

සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදි කිරීමේ ව්‍යපෘතිය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක මට්ටමින් කළුතර, කෑගල්ල, රත්නපුර යන දිස්ත්‍රික්ක වල සමූහ සැකසුම් මධ්‍යස්ථාන 04ක් ඉදි කර අවසන් කිරීම සඳහා රු.මි.9ක් වෙන් කර තිබූ අතර 2012.12.31 වන දිනට රු.මි.3.271ක් පමණක් ලැබීම හේතුවෙන් මෙම ව්‍යපෘතියේ අදාල ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

## තුරුසවිය අරමුදල


## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

## පටුන



1. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන
2. මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශන
3. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
4. ගිණුම් සටහන්
    1. ජංගම නොවන වත්කම්
    2. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්
    3. මුදල් හා මුදල් වලට සමාන වස්තු
    4. උපචිත වියදම්
    5. තුරුසවිය අරමුදල
5. ගිණුම් සටහන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශ
    1. වෙනත් ආදායම්
    2. පුද්ගල පඩිනඩි
    3. ප්‍රවාහන
    4. සැපයුම්
    5. නඩත්තු වියදම්
    6. ගිවිසුම් ගත සෙවා
    7. වෙනත් පුනරාවර්තන වියදම්
    8. සංවර්ධන වියදම්
6. මූල්‍ය  තත්වය පිළිබඳ උපලේඛණ ප්‍රකාශන
    1. තොග
    2. පාරිතෝෂිත සඳහා වෙන් කිරිම
    3. ලැබිය යුතු ණය හා අත්තිකාරම්
    4. විවිධ අත්තිකාරම්
    5. උත්සව අත්තිකාරම්
    6. තැන්පතු
    7. ස්ථාවර තැන්පතු සඳහා උපචිත පොළිය
    8. ස්ථාවර තැන්පතු

## තුරුසවියඅරමුදල
## 2012.12.31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | පිරිවැය | සමුච්චිත ක්ෂය | 2012 රු. ශුද්ධ අගය | 2011 රු. |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| කාර්යාල උපකරණ | 1 | 1,583,864.60 | 837,157.10 | 746,707.50 | 862,264.41 |
| කාර්යාල ලීබඩු | 1 | 786,382.27 | 334,330.24 | 452,052.03 | 379,933.75 |
| යන්ත්‍රෝපකරණ | 1 | 392,702.18 | 392,702.18 | - | - |
| මෝටර් රථ වාහන | 1 | 420,000.00 | 420,000.00 | - | - |
| | | 3,182,949.05 | 1,984,189.52 | 1,198,759.53 | 1,242,198.16 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | උපලේඛනය 1 | | 594,069.54 | | 635,901.79 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් | 2 | | 1,821,185.75 | | 1,550,737.56 |
| මුදල් හා මුදල් සමාන වස්තු | 3 | | 5,006,198.20 | 7,421,453.49 | 4,279,990.23 |
| **මුළු වත්කම්** | | | | **8,620,213.02** | **7,708,827.74** |
| **බැරකම්** | | | | | |
| **ජංගම බැරකම්** | | | | | |
| උපචිත වියදම් | 4 | | 639,184.21 | | (153,842.68) |
| විගණන ගාස්තු සඳහා වෙන්කිරීම | | | 182,893.00 | (822,077.21) | (186,733.00) |
| | | | | | (340,575.68) |
| **මුළු ශුද්ධ වත්කම්** | | | | **7,798,135.81** | **7,368,252.06** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාර්තෝෂිත දීමනා සඳහා | උපලේඛනය 2 | | | 1,536,794.88 | 1,583,815.50 |
| | | | | **6,261,340.93** | **5,784,436.56** |
| **ශුද්ධ වත්කම් / ප්‍රාග්ධන** | | | | | |
| සෙස් අරමුදල | | | | 27,000,000.00 | 27,000,000.00 |
| තුරුසවිය අරමුදල | 5 | | | (20,912,534.07) | (21,389,438.44) |
| ප්‍රදාන ලැබීම් | | | | 151,125.00 | 151,125.00 |
| ප්‍රදාන ලැබීම් / ර.සං. දෙ. | | | | 22,750.00 | 22,750.00 |
| | | | | **6,261,340.93** | **5,784,436.56** |



එන්.ජ්. පියසේන
ගණකාධිකාර



ජ්.ඩී.සී. ජේමරත්න
සභාපති

දිනය : 26 - 04 - 2013

## තුරුසවිය අරමුදල
## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

| | සටහන් | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම්** | | | |
| රජයේ ප්‍රදාන | | 14,979,000.00 | 11,786,773.55 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම ව්‍යාපෘතියට ප්‍රදාන | | 3,367,430.00 | - |
| අනෙකුත් ආදායම් | 1 | 764,930.46 | 484,995.78 |
| සම්පත් බෙදා දීම සඳහා පරිපාලන ගාස්තු | | 4,480.00 | 125,467.50 |
| | | **19,115,840.46** | **12,397,236.83** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 2 | 6,749,334.58 | 6,504,765.34 |
| ප්‍රවාහන | 3 | 504,785.66 | 36,864.75 |
| සැපයුම් | 4 | 683,521.80 | 822,851.82 |
| නඩත්තු වියදම් | 5 | 320,864.55 | 652,037.06 |
| ගිවිසුම් ගත සේවා | 6 | 2,016,316.17 | 1,840,494.64 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 7 | 60,000.00 | 148,101.08 |
| සංවර්ධන වියදම් | 8 | 8,083,738.70 | 5,493,790.27 |
| ක්ෂයවීම් | | 197,214.63 | 188,523.80 |
| හානි හා පාඩු කපා හැරීම් | | | 3,500.00 |
| බිම් තරාදි අලෙවිය (හිඟ) | | 23,160.00 | - |
| **මෙහෙයුම් වියදම් එකතුව** | | 18,638,936.09 | 15,690,928.76 |
| **වියදමට වැඩි ආදායම / ආදායමට වැඩි වියදම** | | 476,904.37 | (3,293,691.93) |

තුරුසවිය අරමුදල
2012.12.31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන

| | 2012 | 2011 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම** | රු. | රු. |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්ත ඌණතාවය | 476,904.37 | (3,293,691.93) |
| එකතු කළා : | | |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | 1,252,883.40 |
| | 476,904.37 | (2,040,808.53) |
| **මුදල් නොවන චංචල** | | |
| ක්ෂයවීම් | 197,214.63 | 188,523.80 |
| පාර්තෝෂික සඳහා වෙන් කිරීම් | (47,020.62) | 333,805.50 |
| ගෙවිය යුතු මුදල්වල වැඩිවීම / අඩුවීම | 481,501.53 | (494,353.02) |
| තොග වැඩිවීම / අඩුවීම | 41,832.25 | (70,787.38) |
| විකුණුම් හා වෙනත් ලැබීම් | (270,448.19) | 2,579,325.23 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **879,983.97** | **495,705.60** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය** | | |
| කාර්යාල උපකරණ | (29,680.00) | (119,509.80) |
| කාර්යාල ලීබඩු | (124,096.00) | (18,786.51) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **726,207.97** | **357,409.29** |
| **මූල්‍ය කටයුතු වලින් මූල්‍ය ප්‍රවාහය** | | |
| ශුද්ධ වැඩිවීම / අඩුවීම මුදල් හා මුදල්වලට සමාන වස්තූන් | 726,207.97 | 357,409.29 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමාන වස්තූන් | 4,279,990.23 | 3,922,580.94 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල්වලට සමා වස්තූන් | **5,006,198.20** | **4,279,990.23** |

සටහන - 1

## තුරුසවිය අරමුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන්
## 2012.12.31 දිනට ජංගම නොවන වත්කම්

| | පිරිවැය | | | | සමුච්චිත ක්ෂය | | | | 2012.12.31 දිනට පොත්වලට අනුව ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 212.01.01 දිනට ශේෂය | වර්ෂය තුළදී මිලදී ගැනීම් | ගැලපීම් | 2012.12.31 දිනට ශේෂය | 2012.01.01 දිනට ශේෂය | ප්‍රවර්තන වර්ෂය සඳහා වෙන් කිරීම් | ගැලපීම් | 2012.12.31 දිනට ශේෂය | |
| කාර්යාල උපකරණ | 1,554,184.60 | 29,680.00 | | 1,583,864.60 | 691,920.19 | 145,236.91 | - | 837,157.10 | 746,707.50 |
| කාර්යාල ලී බඩු | 662,286.27 | 124,096.00 | | 786,382.27 | 282,352.52 | 51,977.72 | - | 334,330.24 | 452,052.03 |
| යන්ත්‍රෝපකරණ | 392,702.18 | - | - | 392,702.18 | 392,702.18 | - | - | 392,702.18 | - |
| මෝටර් රථ වාහන | 420,000.00 | - | - | 420,000.00 | 420,000.00 | - | - | 420,000.00 | - |
| එකතුව | 3,029,173.05 | 153,776.00 | - | 3,182,949.05 | 1,786,974.89 | 197,214.63 | - | 1,984,189.52 | 1,198,759.53 |

## තුරුසවිය අරමුදල මූල්‍ය තත්ව ප්‍රකාශන සටහන්
## 2012.12.31 දිනට

| | | | 2012 | 2011 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| සටහන් 2 | **වෙළඳ හා වෙනත් ලැබීම්** | උපලේඛනය | | |
| | අත්තිකාරම් රබර් ෂීට් මිලදී ගැනීම සඳහා | 3 | 657,072.26 | 657,072.26 |
| | තරාදි ණය | 3 | 559,250.00 | 631,998.75 |
| | ඩයමන් රෝල් ණය ගිණුම | 3 | 127,380.00 | 156,725.00 |
| | විවිධ අත්තිකාරම් | 4 | 8,000.00 | 5,000.00 |
| | මුද්දර අත්තිකාරම් | | | - |
| | උත්සව අත්තිකාරම් | 5 | 11,000.00 | 12,000.00 |
| | තැන්පතු | 6 | 27,000.00 | 27,000.00 |
| | ස්ථාවර තැන්පතු සඳහා උපචිත පොළිය | 7 | 133,363.49 | 60,941.55 |
| | බද්ධ පැල තවාන් ණය | | 298,120.00 | - |
| | **එකතුව** | | **1,821,185.75** | **1,550,737.56** |
| සටහන් 3 | **මුදල් හා මුදල්වලට සමාන වස්තු** | | | |
| | බැංකු ශේෂය A/C No.014100163254138 | | 441,987.22 | 128,722.37 |
| | ස්ථාවර තැන්පතු | 8 | 4,564,210.98 | 4,151,267.86 |
| | **එකතුව** | | **5,006,198.20** | **4,279,990.23** |
| සටහන් 4 | **උපචිත වියදම්** | | | |
| | විදුලිය හා ජල ගාස්තු | | 39,053.84 | 38,765.03 |
| | දුරකථන | | 12,591.91 | 15,791.99 |
| | ඉන්ධන | | 25,990.00 | - |
| | ගමන් වියදම් - දේශීය | | - | 4,587.50 |
| | වාහන නඩත්තු | | 28,950.00 | 6,885.76 |
| | සමිති පිහිටුවීම හා ශක්තිමත් කිරීම | | 5,473.00 | 20,784.40 |
| | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය ද්‍රව්‍ය | | 70,784.00 | 55,440.00 |
| | තොග පාලන | | 369,600.00 | 10,976.00 |
| | පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් | | 2,386.00 | 612.00 |
| | විගණන ගාස්තු | | 63,840.00 | - |
| | සමූහ සැකසුම් මධ්‍යස්ථාන | | 1,327.76 | - |
| | අතිකාල | | 9,687.70 | - |
| | වෙනත් | | 9,500.00 | - |
| | **එකතුව** | | **639,184.21** | **153,842.68** |

**තුරුසවිය අරමුදල මූල්‍ය තත්වයේ ප්‍රකාශන සටහන්**
**2012.12.31 දිනට**

| | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **සටහන් 5** | **තුරුසවිය අරමුදල** | | |
| | ඉදිරියට ගෙන ආ ශේෂය | (21,389,438.44) | (19,348,629.91) |
| | පෙර වර්ෂයේ ගැලපුම් | - | 1,252,883.40 |
| | | (21,389,438.44) | (18,095,746.51) |
| | වර්ෂයේ ආදායමට වැඩි වියදම / වියදමට වැඩි ආදායම | 476,904.37 | (3,293,691.93) |
| | ඉදිරියට ගෙන ගිය ශේෂය | (20,912,534.07) | (21,389,438.44) |

## තුරුසවිය අරමුදල
## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශන

| සටහන් | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1 | **වෙනත් ආදායම්** | | |
| | ස්ථිර තැන්පතු වල පොලිය | 485,365.06 | 257,045.78 |
| | සාමාජික ගාස්තු හා ලියාපදිංචි ගාස්තු | 216,130.00 | 202,950.00 |
| | වෙනත් ආදායම් | 63,435.40 | 25,000.00 |
| | | 764,930.46 | 484,995.78 |
| 2 | **පෞද්ගලික පඩි නඩි** | | |
| | වැටුප් | 4,789,182.92 | 4,699,114.64 |
| | සේවක අර්ථ සාධක අරමුදල් | 640,908.57 | 614,168.35 |
| | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් | 128,181.78 | 122,833.54 |
| | අතිකාල | 23,620.89 | 17,959.02 |
| | ජීවන වියදම් දීමනාව | 345,389.78 | 442,200.00 |
| | පාරිතෝෂිත | 265,021.38 | 333,805.50 |
| | කළමනාකරණ මණ්ඩල දීමනා | 216,000.00 | 189,000.00 |
| | වෙනත් දීමනා | 341,029.26 | 85,684.29 |
| | | 6,749,334.58 | 6,504,765.34 |
| 3 | **ගමන් වියදම්** | | |
| | ගමන් වියදම් - විදේශීය | 467407.66 | |
| | ගමන් වියදම් - දේශීය | 37,378.00 | 36,864.75 |
| | | 504,785.66 | |
| 4 | **සැපයුම්** | | |
| | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 218,019.45 | 453,641.82 |
| | ඉන්ධන හා ලිහිසි තෙල් | 465,502.35 | 369,210.00 |
| | | 683,521.80 | 822,851.82 |
| 5 | **නඩත්තු වියදම්** | | |
| | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 45,854.76 | 64,453.00 |
| | වාහන නඩත්තු | 275,009.79 | 530,161.53 |
| | ගොඩනැගිලි නඩත්තු | - | 57,422.53 |
| | | 320,864.55 | 652,037.06 |
| 6 | **ගිවිසුම් ගත සේවා** | | |
| | දුරකථන හා තැපැල් | 271,059.29 | 285,588.47 |
| | විදුලිය හා ජලය | 264,458.93 | 245,276.93 |
| | වාහන කුලී ගාස්තු | 3,609.00 | 8,390.00 |
| | ගොඩනැගිලි කුලී | 1,301,239.20 | 1,301,239.24 |
| | වෙනත් සේවා | 175,949.75 | - |
| | | 2,016,316.17 | 1,840,494.64 |
| 7 | **වෙනත් පුනරාවර්තන වියදම්** | | |
| | වෙනත් | - | 88,101.08 |
| | විගණන ගාස්තු | 60,000.00 | 60,000.00 |
| | | 60,000.00 | 148,101.08 |

තුරුසවිය අරමුදල

2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශන

| | 2012 | 2011 |
|---|---|---|
| **සටහන් 8 සංවර්ධන වියදම්** | රු. | රු. |
| පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් | 635,057.68 | 551,532.10 |
| සමිති පිහිටුවීම හා ශක්තිමත් කිරීම | 462,527.23 | 140,412.30 |
| දුම්ගෙවල් (සහනාධාර) | 995,628.67 | 832,276.47 |
| සම්පත් බෙදා දීම (සහනාධාර) | 2,717,810.12 | 3,176,716.35 |
| සමූහ සැකසුම් මධ්‍යස්ථාන (සහනාධාර) | 3,272,715.00 | 792,853.05 |
| | 8,083,738.70 | 5,493,790.27 |

උපලේඛනය - 1

2012.12.31 දිනට තොගය

| No: | අයිතමය | ප්‍රමාණය | මිල රු. | වටිනාකම රු. |
|---|---|---|---|---|
| 1 | එයා ප්‍රෙෂ්නර් | 3 | 86.00 | 258.00 |
| 2 | වාර්ෂික වාර්තාව - සිංහල | 385 | 57.62 | 22,182.85 |
| 3 | වාර්ෂික වාර්තාව - ඉංග්‍රීසි | 385 | 57.62 | 22,182.85 |
| 4 | වාර්ෂික වාර්තාව - දෙමළ | 135 | 94.64 | 12,776.40 |
| 5 | සී.ආර්. පොත් - 1 | 8 | 24.51 | 196.08 |
| 6 | සී.ආර්. පොත් - 2 | 10 | 41.80 | 418.00 |
| 7 | සී.ආර්. පොත් - 3 | 7 | 61.25 | 428.75 |
| 8 | සී.ආර්.පොත් - 6 | 11 | 129.58 | 1,425.38 |
| 9 | බයින්ඩින් ෂීට් | 9 | 20.00 | 180.00 |
| 10 | බයින්ඩින් ටේප් | 1 | 180.00 | 180.00 |
| 11 | බාල්දි | 1 | 977.50 | 977.50 |
| 12 | කාබන් කොළ පැකට් - කළු | 2 | 160.00 | 320.00 |
| 13 | කාබන් කොළ පැකට් - නිල් | 2 | 120.00 | 240.00 |
| 14 | සෙලෝ ටේප් | 4 | 33.60 | 134.40 |
| 15 | ප්‍රින්ටරය සඳහා උපකරණ | 1 | 475.00 | 475.00 |
| 16 | ගණක යන්ත්‍රය සඳහා රිබන් | 2 | 12.00 | 24.00 |
| 17 | පරිගණක කොළ (9*5*11) | 1 | 772.80 | 772.80 |
| 18 | ඩයමන් රෝල් | 6 | 31,360.00 | 188,160.00 |
| 19 | මකන | 7 | 3.36 | 23.52 |
| 20 | ලියුම් කවර 10x8 | 1911 | 911x0.80<br>500x0.90<br>500x2.58 | 2,468.80 |
| 21 | ලියුම් කවර 15x8 | 1142 | 512x1.90<br>500x1.50<br>400x4.90 | 3,682.80 |
| 22 | ලියුම් කවර 6x3 | 590 | 90x0.30<br>500x0.75 | 402.00 |
| 23 | ලියුම් කවර 9x3 | 3810 | 1.40 | 5,334.00 |
| 24 | ලියුම් කවර 10x5 | 390 | 0.55 | 214.50 |
| 25 | බොක්ස් ෆයිල් | 5 | 108.00 | 540.00 |
| 26 | ලිපිගොනු ලේස් | 985 | 0.80 | 788.00 |
| 27 | අඩි රූල් | 10 | 22.40 | 224.00 |
| 28 | ෆැක්ස් යන්ත්‍රය සඳහා රිබන් | 1 | 2156.00 | 2,156.00 |
| 29 | ෆයිල් කවර | 165 | 3.30 | 544.50 |
| 30 | ක්ෂේත්‍ර සටහන් පොත් (රූල් සහිත) | 57 | 13.80 | 786.60 |
| 31 | ක්ෂේත්‍ර සටහන් පොත් (රූල් රහිත) | 72 | 13.80 | 993.60 |
| 32 | පොදු - 58 | 5 | 217.28 | 1,086.40 |
| 33 | පොදූ - 268 | 10 | 56.00 | 560.00 |
| 34 | පොදූ - 267 | 5 | 38.08 | 190.40 |
| 35 | ගම් ටේප් (Tan tape) | 5 | 4x26.00<br>1x170 | 274.00 |
| 36 | ගම් බෝතල් කුඩා | 8 | 45.00 | 360.00 |
| 37 | හාෆ් ෂීට් පැකට් | 22 | 2x330.40<br>20x241.60 | 7,492.80 |
| 38 | හයිලයිට් පෑන් - නිල් | 3 | 34.50 | 103.50 |
| 39 | හයිලයිට් පෑන් - රෝස | 4 | 34.50 | 138.00 |
| 40 | හයිලයිට් පෑන් - කහ | 3 | 56.00 | 168.00 |

| No: | අයිතමය | ප්‍රමාණය | මිල රු. | වටිනාකම රු. |
|---|---|---|---|---|
| 41 | හයිලයිට් පෑන් - කොළ | 6 | 34.50 | 207.00 |
| 42 | මයික්‍රො කැසට් පටි | 1 | 100.00 | 100.00 |
| 43 | මාකර් පෑන් | 1 | 85.00 | 85.00 |
| 44 | මයික් | 1 | 550.00 | 550.00 |
| 45 | අල්පෙනෙති පැකට් | 7 | 1x12.50<br>6x25.20 | 163.70 |
| 46 | ෆොටෝ කොපි කඩදාසි - A4 පැකට් | 12 | 500.00 | 6,000.00 |
| 47 | ෆොටෝ කොපි කඩදාසි - B4 පැකට් | 2 | 1x503.70<br>1x750.00 | 1,253.70 |
| 48 | ෆොටෝ කොප් කඩද්ාසි - A3 පැකට් | 1 | 1070.00 | 1,070.00 |
| 49 | කාබන් පෑන් - නිල් | 155 | 55x10.50<br>100x10.92 | 1,669.50 |
| 50 | කාබන් පෑන් - කළු | 79 | 10.50 | 829.50 |
| 51 | කැබන් පෑන් - රතු | 89 | 10.50 | 934.50 |
| 52 | පන්චර් කුඩා | 3 | 82.00 | 246.00 |
| 53 | වෙක්පත් ලියන පෑන් | 21 | 50.40 | 1,058.40 |
| 54 | පැන්සල් | 3 | 7.4666 | 22.41 |
| 55 | පේපර් ක්ලිප් පැකට් | 16 | 16.00 | 256.00 |
| 56 | ජ්.එස්.එම්. කඩදාසි - කහ | 777 | 1.214 | 943.33 |
| 57 | ජ්.එස්.එම්. කඩදාසි -කොළ | 1693 | 193x0.88<br>500x1.045<br>1000x1.20 | 1,892.34 |
| 58 | ජ්.එස්.එම්. කඩදාසි - රෝස | 1259 | 1.57 | 1,974.11 |
| 59 | ෆ්ල්ස්කැප් කොළ | 172 | 0.86 | 147.92 |
| 60 | පන්චර් ලොකු | 2 | 140.00 | 280.00 |
| 61 | ප්ලැටිග්නම් පෑන් - කළු | 2 | 12.00 | 24.00 |
| 62 | රෝනියෝ කඩදාසි | 11 | 291.20 | 3,203.20 |
| 63 | වාර්තා - 6 මාසික | 5000 | 6.552 | 32,760.00 |
| 64 | රෝනියෝ තීන්ත | 5 | 370 | 1,850.00 |
| 65 | ස්ටේප්ලර් කටු | 29 | 16.00 | 464.00 |
| 66 | රබර් රෝල් ජෝඩු රදවනය | 2 | 3,162.50 | 6,325.00 |
| 67 | කතුරු | 1 | 120.00 | 120.00 |
| 68 | සර්වියට් | 7 | 1x30.00<br>6x50.00 | 330.00 |
| 69 | තීන්ත පෑඩ් | 2 | 87.50 | 175.00 |
| 70 | ස්ටෙන්සිල් පැකට් | 3 | 716.80 | 2,150.40 |
| 71 | සීල් - එම්බෝස් | 1 | 1,200.00 | 1,200.00 |
| 72 | පෙරහන්කඩ | 1 | 750.00 | 750.00 |
| 73 | සීල් රබර් | 6 | 5x200.00<br>1x270.00 | 1,270.00 |
| 74 | ස්ටේප්ලර් කටු ලොකු | 2 | 75.00 | 150.00 |
| 75 | ස්පයිරල් 10mm | 41 | 5.50 | 225.50 |
| 76 | ස්පයිරල් 12mm | 40 | 8.50 | 340.00 |
| 77 | ස්ටේප්ලර් මැෂින් | 1 | 170.00 | 170.00 |
| 78 | දියරෝල් | 6 | 30,240.00 | 181,440.00 |
| 79 | ටිපෙක්ස් | 6 | 37.00 | 222.00 |
| 80 | ටෝනර් (ඡායා පිටපත් යන්ත්‍රයට) | 2 | 1x11,760.00<br>1x10,976 | 22,736.00 |
| 81 | විනිවිද කඩදාසි | 21 | 6.35 | 101.60 |
| 82 | තැටි | 109 | 349.00 | 38,041.00 |
| 83 | ෆැක්ස් යන්ත්‍රය සඳහා වයර් කෝඩ් | 1 | 475.00 | 475.00 |
| | **එකතුව** | | | **594,069.54** |

උපලේඛනය - 2

**පාර්තෝෂික දීමනා**

| නම | පත්වීම් දිනය | සේවා කාලය අවුරුදු | 2012.12.31 දිනට වැටුප | පාර්තෝෂික දීමනා |
|---|---|---|---|---|
| එච්.ඒ.එස්.කුමාරි විමලසූරිය මිය | 2010.07.01 | 2 | 42,947.88 | 42,947.88 |
| ලලනි ගමගේ මහත්මිය | 2005.05.05 | 7 | 24,453.00 | 85,585.50 |
| ආර්.ආර්.දෙහිපිටිය මහත්මිය | 2000.12.12 | 12 | 27,930.00 | 167,580.00 |
| එල්.ඒ.පී. චන්ද්‍රිකා මහත්මිය | 2000.12.12 | 12 | 27,930.00 | 167,580.00 |
| ජේ.එන්.සෙනානායක මහත්මිය | 2000.12.12 | 12 | 27,596.50 | 165,579.00 |
| එස්.වී.තුෂාරි ප්‍රියංගිකා මහත්මිය | 2002.07.01 | 10 | 24,453.00 | 122,265.00 |
| එන්.ඩී.රාජපක්ෂ මහත්මිය | 2002.07.01 | 10 | 24,453.00 | 122,265.00 |
| ජී.කේ.එස්.කුමාර මහතා | 2002.07.01 | 10 | 24,453.00 | 122,265.00 |
| කේ.ඩබ්.එම්.සී.ප්‍රියදර්ශනී මහත්මිය | 2002.08.29 | 10 | 21,868.00 | 109,340.00 |
| ජී.ජී.එස්.පී.ද සිල්වා මහත්මිය | 2002.08.29 | 10 | 21,868.00 | 109,340.00 |
| ආර්.එම්.ඒ.රත්නායක මහත්මිය | 2002.08.29 | 10 | 21,868.00 | 109,340.00 |
| ඩී.එම්.එම්.කුමාරිහාමි මෙනෙවිය | 2002.08.29 | 10 | 21,868.00 | 109,340.00 |
| එල්.එම්.ඩී.පී.කේ.සමරතුංග මයා | 2002.07.01 | 9 | 20,673.50 | 103,367.50 |
| **එකතුව** | | | **332,361.88** | **1,536,794.88** |

උපලේඛනය - **03**

### තුරුසවිය අරමුදල මූල්‍ය තත්ව ප්‍රකාශන සඳහා වූ උපලේඛනය
### **2012.12.31** දිනට තුරුසවිය සමිති වෙතින් ලැබිය යුතු ණය සහ අත්තිකාරම් මුදල

| | දිස්ත්‍රික්කය | **2012.01.01** දිනට ශෙෂය | | | වර්ෂය තුළ ලැබීම් | | | | | **2012.12.31** දිනට ඉතිරිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | රෝල් ජෝඩු | | | | | |
| | | අත්තිකාරම් | තරාදි | රෝල් ජෝඩු | අත්තිකාරම් | තරාදි | මුදල් ලැබීම් | සම්පත් බෙදා හැරීමේ ගිණුමට මාරුකිරීම | එකතුව | අත්තිකාරම් | තරාදි | රෝල් ජෝඩු |
| 1 | කළුතර | 381,372.26 | 361,828.75 | 44,690.00 | | 28,378.75 | 5,672.50 | 18,672.50 | 24,345.00 | 381,372.26 | 333,450.00 | 20,345.00 |
| 2 | කෑගල්ල | 152,600.00 | 42,530.00 | 112,035.00 | | | 5,000.00 | | 5,000.00 | 152,600.00 | 42,530.00 | 107,035.00 |
| 3 | රත්නපුර | 110,000.00 | 153,690.00 | | | 44,370.00 | | | - | 110,000.00 | 109,320.00 | |
| 4 | ගම්පහ | 13,100.00 | 73,950.00 | | | | | | - | 13,100.00 | 73,950.00 | |
| | එකතුව | **657,072.26** | **631,998.75** | **156,725.00** | **-** | **72,748.75** | **10,672.50** | **18,672.50** | 29,345.00 | **657,072.26** | **559,250.00** | **127,380.00** |

## තුරුසවිය අරමුදල මූල්‍ය තත්ව ප්‍රකාශන උපලේඛනය 2012.12.31

### උපලේඛනය - 4

**විවිධ අත්තිකාරම්**

| | | |
|---|---|---|
| | එච්.ඒ.එස්.කේ.විමලසූරිය මහත්මිය | 8,000.00 |
| | | **8,000.00** |

### උපලේඛනය - 5

**උත්සව අත්තිකාරම්**

| | | |
|---|---|---|
| 1 | එච්.ඒ.එස්.කේ.විමලසූරිය මහත්මිය | 1,000.00 |
| 2 | ලලනි ගමගේ මහත්මිය | 1,000.00 |
| . | එල්.ඒ.පී.චන්ද්‍රිකා මහත්මිය | 1,000.00 |
| 4 | නිෂාදි සෙනානායක මහත්මිය | 1,000.00 |
| 5 | නයනා දර්ශනී රාජපක්ෂ මහත්මිය | 1,000.00 |
| 6 | සඳකැළුම් ප්‍රභාද සිල්වා මහත්මිය | 1,000.00 |
| 8 | මංගලා කුමාරිහාමි මෙනෙවිය | 1,000.00 |
| 9 | අමිතා රත්නායක මහත්මිය | 1,000.00 |
| 10 | චන්දිමා ප්‍රියදර්ශනී මහත්මිය | 1,000.00 |
| 11 | සුදත් ගලබඩ මහතා | 1,000.00 |
| 12 | ප්‍රසන්න සමරතුංග මහතා | 1,000.00 |
| | | **11,000.00** |

### උපලේඛනය - 6

**තැම්පතු**

| | | |
|---|---|---|
| 1 | ඉන්ධන තැම්පතු<br>ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමය | 25,000.00 |
| 2 | ඩයලොග් ආසියාටා පීඑල්සී | 2,000.00 |
| | | **27,000.00** |

## උපලේඛනය - 7

ස්ථාවර තැන්පතු සදහා උපචිත පොළිය

| බැංකුවේ නම | ස්ථාවර තැන්පතු අංකය | කාල සීමාව | අගය රු. |
|---|---|---|---|
| මහජන බැංකුව | 014-60-01-00004004-8 | 2012.08.31 - 2012.12.31 | 34,431.64 |
| | 014-60-01-00004003-9 | 2012.08.31 - 2012.12.31 | 34,431.64 |
| | 014-60-01-00004199-3 | 2012.11.05 - 2012.12.31 | 54,011.03 |
| | 014-60-01-00006349-7 | 2012.10.14 - 2012.12.31 | 10,489.18 |
| එකතුව | | | **133,363.49** |

## උපලේඛනය - 8

ස්ථාවර තැන්පතු

| බැංකුවේ නම | ස්ථාවර තැන්පතු අංකය | අගය රු. |
|---|---|---|
| මහජන බැංකුව | 014-60-01-00004004-8 | 850,013.89 |
| | 014-60-01-00004003-9 | 850,013.89 |
| | 014-60-01-00004199-3 | 2,514,543.87 |
| | 014-60-01-00006349-7 | 349,639.33 |
| එකතුව | | **4,564,210.98** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My no: එල්පී/පී/ටීආර්එස්එෆ්/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2014 මැයි 13 දින

සභාපති,

තුරුසවිය අරමුදල

තුරුසවිය අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

තුරුසවිය අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ **13(1)** වගන්තිය සහ **2000** අංක **23** දරන තුරුසවිය අරමුදල් පනතේ **21(2)** වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2013 ජූලි 29 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණකක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම
------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන
------------------

තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට තුරුසවිය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------------

1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික දීමනා ලෙස රු.374,201 ක් ගෙවීම් කර තිබුණද, පාරිතෝෂිත වෙන් කිරීම් ගිණුමේ රු.312,042 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකශනවල පාරිතෝෂිත වියදම රු.62,159 ක් අඩුවෙන් සටහන් කර තිබූ අතර, එය වෙනත් දීමනා ගිණුමට එකතු කර තිබූ බැවින් එම ගිණුමෙහි වැඩිපුර රු.62,159 ක් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇලුමිනියම් තැටි ආරම්භක ශේෂය ලෙස තැටි 215 ක් එකක් රු.349 බැගින් රු75,035 ක් ලෙස ගණනය කර දක්වා තිබූ අතර, වර්ෂය තුළ තැටියක් රු.210 බැගින් තැටි 128 ක් විකුණා එකතුව රු.26,880 ක් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව අවසන් තොගය ලෙස ඉතිරි විය යුතු තැටි ගණන 87 ක් වුවත් තැටි 109 ක් රු.349 බැගින් රු.38,041 ක් අවසන් තොගයෙහි දක්වා තිබූ බැවින් තැටි 22 ක් රු.349 බැගින් රු.7,678 ක් තොගයෙහි වැඩිපුර දක්වා තිබුණි.

(ඇ) තුරුසවිය අරමුදලේ ගිණුම්කරණ සටහන්වලට අනුව වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගන්නා බව සඳහන් වුවද, වෙනත් ආදායම් තුළ අන්තර්ගත වූ සාමාජික මුදල් ආදායම, මුදල් පදනම මත ගිණුම්වලට ගලපා තිබුණි.

2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අරමුදල විසින් බිම් තරාදි, සමිති සාමාජිකයින්ට ලබාදීමේදී විවිධ මිල ගණන් වලට විකුණා ඇති අතර, එයින් වැඩි මිලට මිලදී ගත් සමිති සාමාජිකයින්ට අසාධාරණයක් හා එමගින් වංචාවක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

| තරාදියක් විකුණු මුදල | සමිති ගණන | මුළු වටිනාකම |
|---|---|---|
| රු. | | රු. |
| 14,790.00 | 6 | 88,740.00 |
| 9,000.00 | 3 | **27,000.00** |
| 15,000.00 | 1 | 15,000.00 |
| 13,378.75 | 1 | 13,378.75 |

බොහෝ තුරුසවිය සමිති විසින් බිම් තරාදි සහන මිලට ඉල්ලුම් කර තිබූ අතර, අරමුදල විසින් එම තරාදි සමිතිවලට දීම ගැන නොසලකා තනි පුද්ගලයන්ට අඩු මිලට විකුණා ලැබූ අලාභය වූ රු.23,160 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුමට ගලපා තිබුණි.

2.2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

---------------------------------

(අ) තුරුසවිය සමිති වෙතින් තුරුසවිය අරමුදලට අයවිය යුතු , එකතුව රු.1,343,702 ක් වූ ණය මුදල් වර්ෂ 5 කට වැඩි කාලසීමාවක සිට අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම අයවිය යුතු ශේෂයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම අයවිය යුතු ණය ශේෂයන් සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීම්ද ලබාගෙන නොතිබුණි.

(ආ) ඉන්ධන සඳහා තැන්පතු ලෙස දක්වා තිබූ රු.25,000 ක මුදලින් හිඟ ඉන්ධන මුදල් ශේෂය වූ රු.7,260 ක මුදල අඩු කිරීමෙන් පසු සත්‍ය වශයෙන් තැන්පතු මුදල රු.17,740 කි. ඒ අනුව වැඩිපුර රු.7,260 ක් තැන්පතු ලෙස දක්වා තිබුණි.

2.2.4 නීති ,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1993.12.31 දිනැති අංක පීජ්ඒ/6/1/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | අරමුදලේ සභාපති රු.466,408 ක වියදම් දරා ඉතාලි සංචාරයකට සහභාගි වී තිබූ අතර, සංචාරයෙන් අරමුදලට අත්වී ඇති ප්‍රයෝජන, නව අදහස් සම්බන්ධ වාර්තාවක් **2013 ඔක්තෝබර් 14** දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය භාණ්ඩාගාරයෙන් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රු.18,346,430 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු රු.476,904 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද රු.11,786,774 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු රු.3,293,692 ක ඌනතාවයක් වූයෙන් පසුගිය වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,770,596 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**3.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) 2012 වර්ෂය සඳහා රු.18,638,936 ක් වූ අරමුදලේ සමස්ථ වියදමෙන් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණේ රු.8,083,739 ක් හෙවත් සියයට 43 ක් පමණි.

(ආ) 2012 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත රු.24,992,100 ක් වූ වියදම මූල්‍යනය කිරීම සඳහා අරමුදල විසින් රු.1,013,000 ක ස්වකීය ආදායමක් රැස්කිරීමට බලාපොරොත්තු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රැස්කර තිබුණේ ඉන් රු.764,930 ක් හෙවත් සියයට 76 ක ආදායමක් පමණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2000 අංක 23 දරන තුරුසවිය පනත ප්‍රකාර තුරුසවිය අරමුදල පිහිටුවීමේ පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට තුරුසවිය සමිති 671 ක් ලියාපදිංචි කර තිබුණි. සමිති රැසක් අක්‍රිය තත්ත්වයේ පවතින බවත්, සමිති මඟින් සාමාජිකයින්ට ඉටු කෙරෙන කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳව නිසි අවබෝධයක් ඔවුන් අතර නොමැති සමිති පවා තිබූ බවත්, නිරීක්ෂණය විය. වර්ෂය තුළදී අලුතින් ලියාපදිංචි කර තිබුණේ සමිති 04 ක් පමණි.

(ආ) සමිති විසින් ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කිරීම දුර්වල මට්ටමක පැවතුණු අතර, ලියාපදිංචි කරන ලද සමිති 671 න් සමිති 600 ක් 2012 වසර සඳහා අර්ධ වාර්ෂික වාර්තා හෝ එවා නොතිබුණි.

(ඇ) දැනට ක්‍රියාකාරී සමිතිවල කාර්යසාධනය ඇගයීමේ සක්‍රිය වැඩ පිළිවෙලක් නොමැති බව අර්ධ වාර්ෂික වාර්තා මඟින් ඉදිරිපත් වූ තොරතුරු අනුව අනාවරණය විය.

(ඈ) දිස්ත්‍රික්ක මට්ටමින් අරමුදල විසින් නිලධාරීන් පත්කර තිබුණද අධීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) රබර් වතු හිමියන්ගේ නිෂ්පාදන තත්ත්වය දිරිගැන්වීම සඳහා රබර් රෝල් ජෝඩු, සමූහ සැකසුම් මධ්‍යස්ථාන ලබාදුන්නද ඒවා උපයෝජනය කිරීම පිළිබඳව පසු විපරම් කිරීමක් සිදුකර තිබූ බවට වාර්තා නොවුණි.

(ඊ) සමිති පිහිටුවීම හා ශක්තිමත් කිරීම සඳහා රු.462,527 ක වියදමක් දරා තිබූ නමුත් වියදම් දැරීමෙන් අනතුරුව පසු විපරම් කිරීමක් සිදුකර තිබූ බව හෙළිදරව් නොවුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී ඇනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 25 ක් සැලසුම් කර තිබුණද, රු.635,058 ක් වැය කර ඉන් 18 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඌ) 2012 වර්ෂයේ දිවිනැගුම වැඩසටහන යටතේ සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා රු.මිලියන 9 ක් සමිති 4 කට ලබාදීමට තෝරාගෙන තිබුණත්, දෙන ලද කාලසීමාව තුළ අදාළ කාර්යයන් නිමකර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

තුරුසවිය අරමුදල මගින් සාමාජිකයින්ගෙන් අයකර ගනු ලබන සාමාජික මුදල් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් සමිතිවලින් ලැබියයුතු සාමාජික අරමුදල් සහ වර්ෂය තුළ මුදලින් ලැබීම් විධිමත් පරිදි වාර්තාගත කර නොතිබුණි.

(ආ) සාමාජික මුදලින් තුරුසවිය අරමුදලට බැර කරනු ලබන සියයට 50 ක මුදල සඳහා විධිමත් වාර්තා පවත්වා නොතිබුණි.

(ඇ) එකතු කරගනු ලබන සාමාජික මුදලින් සාමාජිකයින්ට ප්‍රතිලාභ සැලසිය හැකි විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා නොතිබීම හේතුවෙන් තුරුසවිය අරමුදල ගන්නා ලද තීරණ බොහොමයක් තුරුසවිය සමිති මගින් ක්‍රියාත්මක නොකරන බව නිරීක්ෂණය විය.

(ඈ) සාමාජික මුදල් ගෙවීමේදී සමිති සාමාජිකයින්ට සමිතිය විසින් ලදුපත් නිකුත් කිරීමේදී ඒවා පසුව වෙනස් කිරීම, ලදුපත් අනු අංක පිළිවෙලින් නිකුත් නොකිරීම, විවිධ අංක වල ලදුපත් නිකුත් කිරීම, සමිතියෙන් හා ප්‍රධාන කාර්යාලයෙන් එක් සාමාජික මුදල් ලැබීමක් සඳහා ලදුපත් 2 ක් නිකුත් කිරීම.

(ඉ) ඉදිරි වැඩසටහන්, අනුමත වැඩසටහන් හා කළ වැඩසටහන්වල නොගැලපීම් තිබුණු අතර, සංශෝධනයන් නැවත අනුමත කර නොතිබුණි. අධීක්ෂණය නොවූ හා අනුමත නොවූ කළ වැඩසටහන් සඳහා ගමන් වියදම් අනුමත කර තිබුණි.

4.3 අරමුදල් උපයෝජනය

------------------------

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් වෙනුවෙන් රජය විසින් රු. 10,292,000 ක් අරමුදල වෙත ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රදාන ලබා ගැනීමේදී අරමුදල විසින් 2012 ජනවාරි 01 දිනට ආයෝජනය කර තිබුණු රු.4,151,268 ක් වූ මුදල් භාණ්ඩාගාරයට අනාවරණය කර නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මෙම ආයෝජනයෙහි වටිනාකම රු. 4,564,211 ක් විය.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

(අ) තුරුසවිය අරමුදල විසින් රබර් රෝල් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රබර් ගොවීන්ට සියයට 50 ක සහනාධාරයක් ලබාදෙන බැවින් රබර් රෝල් මැෂිමෙහි ගුණත්වය හා අඩු මිල සළකා බැලිය යුතු වුවත් එලෙස සිදු නොකර රු.173,280 ක අනාර්ථික වියදමක් දරා තිබුණි.

(ආ) රබර් පර්යේෂණ ආයතනය විසින් අනුමත ගුණාත්මකභාවය නොමැතිවීම හේතුවෙන් 2008 වසරේ මිලදී ගෙන තිබූ කිරිපිහි 743 න් කිරිපිහි 575 ක් 2011 දෙසැම්බර් 31 වන විටත් ගබඩාවේ පැවති අතර ඒවා මලකඩකා තිබුණි. 2012 වර්ෂයේදී ඒවා සාමාජිකයන්ට නොමිලයේ ලබාදී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

5.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයයන් 11 ක් සම්බන්ධයෙන් සියයට 5 සිට සියයට 664 දක්වා අයවැයගත වියදම ඉක්මවා වියදම් කර තිබුණු බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇත. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) තොග පාලනය
(ඇ) ගෙවීම් ක්‍රියාවලිය
(ඈ) තුරුසවිය සමිති විධිමත්ව ලියාපදිංචි කිරීම
(ඉ) කාර්ය සාධන ක්‍රියාවලිය
(ඊ) ආදායම් හඳුනාගැනීම

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති